**කැලණිය අධ්‍යාපන කලාපය**

**චිත්‍ර කලාව - අත්පොත - දෙවන වාරය**

**7 ශ්‍රේණිය**

පරිසරය ආශ්‍රිත තේමා යටතේ චිත්‍ර සංරචනය කරයි.

තේමාවට උචිත මානව රූප, ඉරියව්, වර්ණ යොදා දී ඇති චිත්‍ර අධ්‍යනය කර පහත සඳහන් මාතෘකා යටතේ චිත්‍ර ඇඳ වර්ණ කරන්න.

1.2.1.ආගමික පරිසරය ඇසුරෙන් බැතිබර අවස්ථාවක් චිත්‍රයට නගමු.





1.2.2. වනයේ සැරිසරන සතුන්

උදාහරණ



1.2.3. ඇළක, ගඟක දිය නාන මිතුරන්

උදාහරණ



2.1.2. ඝනකයක් හා බෝලයක් රේඛාවෙන් අඳින්න ( ද්‍රව්‍යවල ස්වභාවය හා ගති ලක්ෂණ පෙන්නුම් කරන්න).

උදාහරණ-



2.2.1.අන්තුරියම් පැළෑටියක් දැමු මැටි කළයක් හා සනකයක් ඇඳ වර්ණ කරන්න.

උදාහරණ-



3.1.2. මුලුතල මෝස්තරයක් සඳහා සැරසිල්ලක් නිර්මාණය කරන්න ( බුමුතුරුණු, කුෂන් කවර, වියන් සැරසිලි, බන්දේසි, මේස රෙදි)

උදාහරණ-



3.2.1.ස්වභාවික හා වියුක්ති හැඩ ඇසුරෙන් සැරසිලි රටා නිමවමු.
(ව්‍යාප්ත සැරසිලිවල මූලික ලක්ෂණ, ස්වභාවික හැඩ හා වියුක්ත හැඩ, සැරසිලි ඒකක රටාවකට යෙදීමෙන් ව්‍යාප්ත සැරසිල්ලක් ඇඳීම. සංගත හා විසංගත වර්ණ වල ප්‍රභේද භාවිතය)

උදාහරණ-



4.2.1.දැන්වීමක් නිර්මාණය කරමු ( අක්ෂර හා රූප විදිමත්ව හා නිර්මාණශීලීව ගළපන්න. පාසලේ නර්තන ප්‍රසංගයක්, සංගීත ප්‍රසංගයක්, ආගමික උත්සව අවස්ථාවක්, පාසලේ චිත්‍ර ප්‍රදර්ශනය)

උදාහරණ-



5.2.1. නිර්මිත සහ ස්වභාවික හැඩතල ඇතුළත් අල්ප උන්නත කැටයමක් නෙළමු ( පිහිටි තලයෙන් හැඩ මදක් / යන්තමින් මතුකොට සෘජුෆෝම් මාධ්‍යයෙන්, කඩදාසියක නිර්මාණය ඇඳ සෘජුෆෝම් එකෙහි නෙළාවර්ණ කිරීම).



6.2.1. රූකඩ නිර්මාණ අගයමු.

- රූකඩ වර්ග 5ක් ජනප්‍රියව ඇත ( නූල් රූකඩ, අත් රූකඩ, සෙවනැළි රූකඩ, රිටි රූකඩ, ඇඟිලි රූකඩ)



*නූල් රූකඩ*



*අත් රූකඩ*



*සෙවනැළි රූකඩ*



*රිටි රූකඩ*



*ඇඟිලි රූකඩ*

- නූල් රූකඩ ශ්‍රී ලංකාවේ පාරම්පරික ජනකලාවකි. ඓතිහාසික හා කාලීන කථාවස්තු (ඇහැළේපොළ, වෙස්සන්තර ජාතකය, කාලගෝල, අංගුලිමාල කතා). වෙසක් පොසොන් , ආගමික උත්සව අවස්ථාවන්හිදී රූකඩ සංදර්ශන පැවැත්වීම අතීතයේ සිට ග්‍රාමීය ප්‍රජාව සිදුකරන ලද්දකි.

- රූකඩ නාට්‍යය සඳහා නුර්ති හා නාඩගම් ගීත ගායනය, දෙබස් කීම රූකඩ නාට්‍යය ශිල්පීන් විසින්ම කරනු ලබයි. රූකඩ නාට්‍යය සඳහා විශේෂ වේදිකා හා පසුතල නිර්මාණද සකස් කරන අතර ඒවා ඇස් මට්ටමෙන් ඉහළ සකස් කෙරේ.

- නූල් රූකඩය සම්බන්ධය අත්පා හිස චලනය වන ආකාරයෙනි. ඒ සඳහා බයිසිකල් ටියුබ් භාවිත කරන අතර රූකඩ නිර්මාණ සඳහා කඳුරු ලී හෝ රුක් ඇත්තන ලී හා ඊට අමතරව රෙදි, නූල් යකඩ ඇණ, පබළු වර්ග, සායම් වර්ග භාවිත කෙරේ.

- රූපවාහිනී මාධ්‍යය තුළ අත් රූකඩ හා රිටි රූකඩ ජනප්‍රිය වේ. අත් රූකඩ ඉතා සරලව රෙදි කැබලි, අත් මේස්, බොත්තම්, පබළු, නූල්, මැලියම් කම්බි වැනි ද්‍රව්‍ය භාවිත කරයි.

*ඇගයීම*

1. රූකඩ වර්ග 5ක් නම් කරන්න.
2. රූකඩ සඳහා යොදා ගන්නා ඓතිහාසික කතා කීපයක් නම් කරන්න.
3. රූකඩ නිර්මාණ සඳහා යොදාගත් අමුද්‍රව්‍ය කීපයක් නම් කරන්න.
4. රූපවාහිනී මාධ්‍යය තුළ ජනප්‍රිය රූකඩ වර්ග මොනවද?

7.2.1. ප්‍රාග් ඓතිහාසික සිතුවම් අගයමු.

- ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික නිර්මාණ වැඩි වශයෙන් හමුවන්නේ උතුරු මැද හා නැගෙනහිර ප්‍රදේශවලය. වසර දෙලක්ෂ පනස් දහසක් තරම් පැරණි මානව හා ශිලා මෙවලම් සාධක හමුවේ. ඒ අනුව චිත්‍ර වසර 3000ක් තරම් ඉපැරණි බව මහාචාර්ය ඩී. බී. නන්දදේව සහ මහාචාර්ය ඊ. පී.දැරණියගල අනුමාන කරයි.

- මෙම චිත්‍ර වැදි ජනතාව විසින් අඳින ලද නිර්මාණ වශයෙන් සෙලිග්මාන් විසින් හඳුන්වා දී ඇත.මෙම චිත්‍රවල වස්තු විෂය වී ඇත්තේ මිනිසුන් සහ සතුන්ය ( අලියා, දිවියා, සිංහයා, කිඹුලා, පත්තැයා,මුවා, ගෝනා, වඳුරා, තලගොයා,මොනරා). මෙම චිත්‍ර සරල හැඩතල ආකාරයට ආදී මානවයාගේ ප්‍රධාන ජීවනෝපාය පිළිඹිබු කරන බව විචාරක මතයයි.


- ප්‍රධාන ශිල්ප ක්‍රමය ලෙස රේඛාමය සටහන්, ලී කැබැල්ලකින් හෝ ඇඟිල්ලකින් සායම් තැවරීම, සිරීමෙන් මතු කිරීමේ ක්‍රමයද, වර්ණ ලෙස අගුරු, කිරිමැටි, සත්ත්ව ලේ, වතුර හෝ මැලියම් සමග මිශ්‍ර කර ඇත.

- තනි රූප හා යුගල රූප ජ්‍යාමිතික හැඩ හා සංකේත රූප යොදා ගැනීම.

- තන්තිරිමලේ, දොරවක හා බිල්ලෑව ප්‍රාග් ඓතිහාසික චිත්‍ර ඇති වැදගත් ස්ථාන වේ.

<u>**තන්තිරිමලේ ප්‍රාග් ඓතිහාසික සිතුවම්**</u>

- අනුරාධපුර මහවිලච්චිය ප්‍රදේශයේ පිහිටා ඇති මෙම ගුහාව 1959 නිකොලොස් විසින් සොයාගන්නා ලදී.




***තන්තිරිමලේ ලෙන***




සතකුගේ පිට මත මිනිසා



පිටපත් කරන ලද සතකුගේ පිට මත මිනිසා සිතුවම



තලගොයා



කණ්ඩායම සම්පිණ්ඩනය/ කොටුවක් (නිවසක්) තුළ ඇති මිනිස් රූප



දුනුවායා




පිටපත් කරන ලද දුනුවායා සිතුවම



මිනිස් සහ සත්ත්ව රූප

__දොරවක ප්‍රාග් ඓතිහාසික සිතුවම්__

- මෙය කෑගලු දිස්ත්‍රික්කයේ බෙලිගල් කොරළේ වරකාපොලට නුදුරු මල්දෙණිය වතුයායේ පිහිටා ඇත.
- 1919 දී ජී.එෆ්.ආර්. බ්‍රෝහියර් සොයගන්නා ලද අතර ඉර හඳ දැක්වෙන චිත්‍ර සටහනක්ද ඇත.



දොරවක ලෙන



මාළුවා සහ මිනිස් රුව



ඇතා සහ පැටවා



පිටපත් කරන ලද ඇතා සහ පැටවා සිතුවම

<u>බිල්ලෑව ප්‍රාග් ඓතිහාසික සිතුවම්</u>


- 1951 දී පී. ඊ. පී. දැරණියගල විසින් සොයා ගන්නා ලද මෙම ලෙනෙහි බහුමාධ්‍යයෙන් නිම කළ චිත්‍රද හමු වී තිබේ.



බිල්ලෑව ගුහාව



සතෙකු පිට යන මිනිසා




පිටපත් කරන ලද සතෙකු පිට යන මිනිසා  සිතුවම



මිනිස් රූප සම්පිණ්ඩනය/කොටුවක්(නිවසක්) තුළ මිනිස් රූප



මොල්ලිය සහිත ගව රූව



පිටපත් කරන ලද මොල්ලිය සහිත ගව රූව සිතුවම

<u>ඇගයීම</u>

තන්තිරිමලේ, දොරවක, බිල්ලෑව ප්‍රාග් ඓතිහාසික ලෙන් සිතුවම් මොනවාදැයි වෙන් වෙන් වශයෙන් ලියන්න.